# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/32 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, අනුරාධපුර නැගෙනහිර ජල සම්පාදන ක්‍රමයේ භූගත ජල තටාකය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/AD/354.
2022 ජනවාරි මස 04 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 247, වන්නියන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වන්නියන්කුලම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි මහතා විසින් මැන සකස් කරන ලද, අංක 294 දරන පිඹුරේ කැබලි අංක 03 ලෙස දැක්වෙන "වන්නියන්කුලම කැලේ" නැමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 37ක් පමණවන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රවේශ මාර්ගය හා අ. ග. පි. 259 හි කැබලි අංක 1469 න් කොටසක් ; |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 259 හි කැබලි අංක 1464 ; |
| *දකුණට* | : | අ. ග. පි. 259 හි කැබලි අංක 1471 ; |
| *බටහිරට* | : | කැබලි අංක 2. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : එම්. එල්. ගුණදාස මහතා,
අංක 29/සී/259,
ශ්‍රී රාහුල මාවත,
වන්නියන්කුලම,
අනුරාධපුරය.

EOG 01 - 0131

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, සයිස්ටන් ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයේ, ගබඩා ජලාශය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/397.
2022 ජනවාරි මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 585, බලකඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සයිස්ටන් C ජනපදය ගමේ පිහිටි, "සයිස්ටන් වත්ත" නැමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 8.1ක් පමණවන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අලවතුගොඩ මල්ගමන්දෙනිය පාරේ සිට නිවාස දක්වා වැටී ඇති මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | සයිස්ටන් C ජනපදයේ සමාධි ආරාමය දක්වා වැටී ඇති මාර්ගය ; |
| *දකුණට* | : | සයිස්ටන් C ජනපදයේ සමාධි ආරාමය පිහිටි ඉඩම (මු. පි. මහ 2678 හි කැබලි අංක 42) ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස (මු. පි. මහ 2678 හි කැබලි අංක 33 න් කොටසක්). |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 1. එස්. ජී. විජේසිරි මහතා,
අංක 24/3, සයිස්ටන් C ජනපදය,
අලවතුගොඩ.

2. පී. ආර්. ජී. කමලාවතී මහත්මිය,
අංක 526, සයිස්ටන් C ජනපදය,
අලවතුගොඩ

EOG 01 - 0132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.